

# පුංචි කොටි පැටියා



කථාව සහ චිත්‍ර
රුසින්දු ගම්ලත්

# පිදුම

මට සෑම විටම කරදර කරන
මගේ කරදරකාරී මගේ අක්කී

සාමන්දී ගම්ලත් ට

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍යය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් ‘‘දිවිය දිනන විද්‍යුත් පොතක්’’ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ‘‘දිවිය දිනන විද්‍යුත් පොතක්’’ ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

# පුංචි කොටි පැටියා

අලි,කොටි, වලසුන් පිරුණු මහා ලොකු කැලෑවක් තිබුණා.
ඒ කැලේ පුංචි කොටි පැටියෙක් එයාගේ අම්මා තාත්තා එක්ක ජීවත් වුණා.

එක දවසක් මේ කොටි පැටියට හිතුනා එයා දැන් හරි ලොකුයි කියලා. ඉතින් එයා දවසක් උදේ අම්මාගෙන් ඇහුවා
"අම්මේ අම්මේ මම දැන් හරි ලොකුයි නේද...?" කියලා.

ඉතින් අම්මා කිව්වා
"ඔව් පුතේ ඔයා දැන් හරිම ලොකු පැටියෙක් " කියලා.





ඉතින් මේ කොටි පැටියට හිතුනා

එයා දැන් ලොකු නිසා කැලේ තනියම ඇවිදින්න

යන්න පුලුවන් කියලා.

එක දවසක් මේ පැටියගෙ අම්මා එයාගේ වලස් යාළුවා එක්ක

ගමනක් ගියා.

ඒ ගමන යන්න කලින් අම්මා පැටියට කිවුවා

" මම ගෙදර එනකම් මගේ පුතා දඟ නොකර ගෙදර ම ඉන්න"

කියලා.

දැන් අම්මා ගෙදර නැති නිසා

කොටි පැටියට ලොකු අවස්ථාවක් ආවා

එයා ලොකුයිද කියලා බලන්න.




ඉතින් මේ පුංචි පැටියට අම්මා කිව්ව දේ අමතක වුණා.

එයා  හිමීට හිමීට කැලේ ඇතුළට ඇවිදගෙන ගියා...

වටින් පිටින් කළුවර වැටීගෙන එනවා.

දැන් නම් කොටි පැටියට ටික ටික භය දැනෙන්න වුණා...

ඇස් දෙකේ කඳුළු පිරිලා.

"මම මේ කැලේ අතරමන් වෙලා නේද? "

හිතුණු කොටි පැටියා හොඳට ම අඬන්න ගත්තා...

මේ අඬන සද්දේ ළඟ ගහක නිදාගෙන

හිටිය වඳුරු මාමට ඇහුණා...





ඇහුණු ශබ්දයට හොදට කන් දුන්න වඳුරු මාමා

"කවුද මේ අඬන්නේ..." කියලා ඇහුවා.

මාමා හිමීට හිමීට පැටියා ළඟට කිට්ටු වුණා.

"ඇයි පැටියෝ අඬන්නේ" කියලා

වඳුරු මාමා කරුණාවෙන් ඇහුවා.

"අනේ මාමේ.... මට ගෙදර යන්න පාර හොයාගන්න බෑ,

මම අම්මාට හොරෙන් ආවේ

අනේ මට උදවු කරන්නකෝ...." පැටියා හරිම දුකෙන් කිවුවා.





වදුරු මාමා පැටියගේ බෙල්ල අතගාලා

"අපි අම්මාව හොයාගන්න යමු " කිව්වා.

මාමයි පැටියයි අම්මා හොයාගෙන හොයාගෙන ගියා...

ඔහොම යනකොට පැටියව හොය හොය කැලේ ඇවිදින

කොටි අම්මව හම්බවුණා.

අම්මා පැටියා දැකලා "මගේ පුතා" කියලා

හරිම ආදරෙන් පැටියා බදාගත්තා.

"මගේ පුතා කොහෙද ගියේ?" කියලා අම්මා ඇහුවා.

"අම්මේ මම අම්මාට කියන්නේ නැතිව තනියම කැලේට ගියා,

ඉතිං මං අතරමං වුණා අම්මේ"..... කියලා කිව්වා.





"අම්මේ මම ආයෙ කවදාවත් ම අම්මාට නොකියා දෙයක් කරන්නේ නෑ . මගේ හොඳ පුතා" කියලා අම්මා පැටියාව බදාගත්තා.

පැටියට උදවු කළ වඳුරු මාමාට අම්මා බොහොමත් ම ස්තූතිවන්ත වුණා..

වැඩිහිටි අවවාද උපදෙස් හොඳින් හිතට ගත්තු කොට් පැටියා ආයෙ කවදාවත් ම දඟ වැඩ කළේ නෑ.....

අම්මයි තාත්තයි එක්ක මේ පුංචි කොට් පැටියා සතුටින් කල් ගත කළා.

<u>නිමි.</u>





# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යොජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරනයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

ISBN No -978-624-208-100-7